# 9 ශ්‍රේණිය සිංහල

## 05 ඒකකය - 2022

# නිවැරදි ශබ්දෝච්චාරණය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

09 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 05. නිවැරදි ශබ්දෝච්චාරණය

පැරණි අධ්‍යාපනයේ දී ප්‍රමුඛතාවක් හිමි වූයේ ශ්‍රවණයට ය. පොත පත බහුල නොවූ සමාජයේ කියවූ දේ ශ්‍රවණය කිරීමෙන් බොහෝ දෙනා දැනුම ලැබූහ. ඔවුහු 'බහුශ්‍රැතයෝ' වූහ.



අද පාසල් අධ්‍යාපනය තුළ කියවීම හා ලිවීම මූලික වෙයි. චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ රචනා කොට ඇත්තේ අසා රස විඳීම අරමුණු කර ගත් බණ කථා රීතියෙනි. ඒවා කියවීමේ දී අර්ථ රසය මෙන් ම ශබ්ද රසය කෙරෙහි ද සැලකිලිමත් වීම අවශ්‍ය ය.

**ලිඛිත අභ්‍යාස**

1. සවන් දෙන්නාගේ අවධානය දිනා ගැනීම සඳහා ප්‍රවෘත්ති කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලියන්න.
2. පාඩමෙහි අන්තර්ගත ශ්ලෝකයෙන් හා ගාථාවෙන් ලබා දෙන උපදේශ ලියන්න.

- **ලිඛිත අභ්‍යාස**

1.
   - ✓ අර්ථය අවබෝධ කර ගනිමින්, විරාම ලක්ෂණවලට අනුගත වෙමින් කියවීම.
   - ✓ නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවීම.

2.

**ශ්ලෝකය - ප්‍රත්‍යය ශතකය 100**

✓ හංසො විභාති සරසීරුහ වාරි මධ්‍යෙ
සිංහො විභාති ගිරිකුංජර නිර්කඩජරෙ ච
ජාතෙයා විභාති තුරගො රණ වීර මධ්‍යෙ
විද්වාන් විභාති පුරුෂෙෂු විචක්ෂණෙෂු

✓ හංසයා බබළන්නේ ජලාශයන්හි දී ය.
සිංහයාගේ වික්‍රමාන්විත බව ඇතුන් මැද ය.
සෛන්ධව අශ්වයාගේ බලය යුද්ධ භූමියේ දී ය.
විද්‍යාවන්ත පණ්ඩිතයාගේ බැබළීම එබඳු ම පණ්ඩිතයන් මැද ය.

## ගාථාව - ධමම පදය - පණ්ඩිත වග්ග

- ✓ න භජෙ පාපකෙ මිතෙත
  න භජෙ පුරිසාධමෙ
  භජේථ මිතෙත කල්‍යාණෙ
  භජේථ පුරිසුතත මෙ
- ✓ පාප මිත්‍රයන් හා අසත්පුරුෂයන් ඇසුරු නොකළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් හා සත්පුරුෂයන් ම ඇසුරු කළ යුතු ය.

**ප්‍රායෝගික අභ්‍යාස**

1. පාඩමේ ඇතුළත් විවිධ ලේඛන, ඊට හිමි ශෛලියෙන් හඬ නගා උච්චාරණය වන සේ පන්තියේ දී ඉදිරිපත් කරන්න.
2. පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ දී හා සිංහල භාෂා තරගවල දී කියවීමේ කුසලතා දැක්වීම සඳහා පාඩමේ ඇතුළත් ලේඛන මැනවින් පරිශීලනය කරන්න.
3. ගුරු උපදෙස් ඇතිව මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවිපොත වැනි පොතක් සපයා ගෙන පන්තියේ කණ්ඩායම් අතර කියවීමේ තරගයක් පවත්වන්න.

# ගුරු අත් පොතේ

- **ශ්ලෝක**
  - ✓ අක්‍රෝධමාරෝග්‍ය ජිතේන්ද්‍රියත්වං
    දයාක්ෂමා සර්ව ජනප්‍රියත්වං
    නිර්ලෝභි දාතා භය ශෝක මුක්තිර්
    ඥාණප්‍රභේදා දශ ලක්ෂණානි (ප්‍රත්‍ය ශතකය)
  - ✓ ක්‍රෝධ නැති බව ද, නිරෝගී බව ද, දිනන ලද ඉඳුරන් ඇති බව ද, දයාවන්ත බව ද, ඉවසීම ද, සියල්ලන්ට ප්‍රිය බව ද, ලෝභ නැති බව ද, ත්‍යාගවන්ත බව ද, භය නැති බව ද, ශෝක නැති බව ද යන මේ දහය ඥානවන්තයාගේ ප්‍රභේද ලක්ෂණයෝ ය.
- **ගාථා**
  - ✓ අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
    ජිණ්ණා කොඤ්චා වඣායන්ති - ඛීණ මච්ඡේව පල්ලලේ
    (ධම්ම පදය)
  - ✓ තරුණ කාලයේ දී බඹසර නො හැසිර, මනා ඉගෙනීමක් නැති ව කල්ගත කළ හොත්, මහලු කාලයේ දී මසුන් නැති විලක් ළඟ බලා සිටින කොස්වාලිහිණියෙකු මෙන් කල් ගෙවන්නට සිදු වේ.

- ගාථා

    ✓ මාතා පෙත්ති භරං ජන්තුං - කුලේ ජෙට්ඨාපචායිනං
    සණ්හංසඛිල සම්භාසං - පෙසුණෙය්‍යප්පහායිනං
    මච්ඡේර විනයේ යුත්තං - සච්චං කෝධාභිභූං නරං
    තං වේ දේවා තාවතිංසා - ආහු සප්පුරිසො ඉති
    (සංයුක්ත නිකාය - දේවා (සත්තවත පද) සුත්ත)

    ✓ මවුපියන් පෝෂණය කිරීම ද, පරපුරේ වැඩිහිටියන්ට ගරු කිරීම ද, මිහිරි වචන කතා කිරීම ද, පරුෂ වචන කතා නොකිරීම ද, මසුරු කමෙන් ඈත් වීම ද, සත්‍ය වචන කතා කිරීම ද, ක්‍රෝධ නොකිරීම ද යන මෙකී ලක්ෂණවලින් යුක්ත පුද්ගලයාට තව්තිසාවේ දෙවියෝ සත් පුරුෂයා යැයි කියති.

- ගාථා

    ✓ දීපඞ්කරාහ්වය මුනීශ්වරපාදමූලේ
    සන්ත්‍යජ්‍ය ලබ්ධමමෘතං කරුණාං විධාය
    අත්‍යාහිතං පරහිතං සුකෘතං විශේෂාත්
    සිද්ධං නමෝස්තු සුගතාය ජිගද්ධිතාය (සකස්කඩ)

- ගද්‍ය පාඨ

    ✓ තව ද සැදෑ ඇත්තවුන්ගේ සැදෑ වඩනට නිසි වූ අනිකුත් කථාවක් දක්වන්නමෝ යම් සේ චක්ඛුපාල තෙරුන් වහන්සේ වෙද ව උපන් ජාතියෙහි නුවණ නමැති ඇස මෝහ නමැති පටලය වැඩීමෙන් කුසල් නමැති ඉඳුරා මඟ නො දැක අකුසල් නමැති විෂම මඟට පැමිණ ලසු වුත් අකුශලය නිසා රහත් වූ ජාතියෙහි අන්ධ වීමෙන් මේ සා හානියක් වී ද එසේ නො ව යම් කෙනෙක් නුවණ නමැති පහන් ඇසින් කුසල් මඟට බැස ලසු වුත් කුශලයෙහි හැසිරෙත් නම් ඒ නිසා ලබන ලොවී ලොවුතුරා සැපත් මට්ටකුණ්ඩලී වස්තුවෙන් දක්වම්හ).
    (සද්ධර්මරත්නාවලිය)

- ගුණාත්මක යෙදවුම්

    ✓ ප්‍රත්‍ය ශතකය
    ✓ බුද්ධ ගජ්ජය
    ✓ සකස්කඩ
    ✓ ධම්ම පදය
    ✓ පන්සිය පනස් ජාතක පොත
    ✓ සද්ධර්මරත්නාවලිය



# විරාම ලක්ෂණ

- කථනයේ දීත් ලේඛනයේ දීත් විරාමය හෙවත් නැවතීම යෙදේ. කථනයේ දී යෙදෙන විරාමය හෙවත් නැවතීම ලේඛනයේ දී නිරූපණය කෙරෙන්නේ විරාම ලක්ෂණ මගිනි. විරාම ලක්ෂණ භාවිතය අදහස් පැහැදිලිව හා නිරවුල්ව ඉදිරිපත් කිරීමට උපකාරී වෙයි.

I. **තිත (.)** - වාක්‍යයක අවසානය දැක්වීම සඳහා/ පුද්ගල නාම මුල’කුරු සමඟ හා නාමයක් කෙටි කොට දැක්වීමේ දී යෙදේ .

- ✓ අහස කළු විය.
- ✓ වැස්සක් ඇද හැලිණි.
- ✓ සිසුහු ගුරුවරුන් නමදිති.
- ✓ පු. බ. තෙන්නකෝන්
- ✓ ක. ග. අමරසේන
- ✓ ආර්. එස්. ගුණවර්ධන
- ✓ ලං.ග.ම. (ලංකා ගමනාගමන මණ්ඩලය)
- ✓ රු. 30/= (රුපියල් 30/=)
- ✓ පූජා. (පූජාවලිය)

II. **කොමාව (,)** - වාක්‍යයක නොයෙක් කොටස් අතර පැවැතිය හැකි ඇතැම් මඳ විරාමය දැක්වීම සඳහායෙදේ.

- ✓ නිල්, රතු, කහ මූලික වර්ණ වේ.
- ✓ ළමයි පාසල් බිමට ඇතුළු ව, මඳක් ක්‍රීඩා කොට, පන්සිල් ගෙන, පන්ති කාමරයට ගොස් ඉගෙනීමෙහි නිරත වූහ.
- ✓ ඇතැම් ස්වදේශික බෙහෙත් ද්‍රව්‍ය: අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, බැබිල, කටුවැල් බටු

III. **දෙතිත (:)** - දෙබසක් ලියා දැක්වීමේ දී ප්‍රකාශකයාගේ නම ඉදිරියෙන් ද පැය සහ විනාඩි ඉලක්කමින් ලිවීමේ දී ද ගණිත ප්‍රකාශනයක අනුපාතයක් ලියා දැක්වීමේ දී ද යෙදේ.

- ✓ ගැමියා : පලදනාව මම වෙන කෙනෙකුට දුන්නා, දේවයන් වහන්ස.
- ✓ රජ : කාට ද?
- ✓ සංගීතඥයා: සංගීතය කියන්නේ විශ්ව භාෂාවක්.
- ✓ රැස්වීම ආරම්භ වූයේ ප.ව. 6:30ට ය.
- ✓ 1:50000 සිතියමක් ඇසුරෙන් පිළිතුරු සපයන්න.
- ✓ ඒ ධනය ඔවුන් දෙදෙනා අතර 2:3 අනුපාතයට බෙදා දක්වන්න.

IV. **කෙටි ඉර (-)** - පද සංයුක්ත ව යෙදෙන කල්හි එහි අන්‍යෝන්‍ය සම්බන්ධතාව දක්වනු සඳහා ද කාලපරිච්ඡේද ආදිය ඉලක්කමින් දැක්වීමේ දී ද යෙදේ.

- ✓ අක්ෂර වින්‍යාසයේ දී ණ-න, ල-ළ භේදය ඉගැන්වේ.
- ✓ සමාජ-දේශපාලන ආයතන
- ✓ ජෛව-රසායනික විපර්යාස
- ✓ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය
- ✓ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2017-10-05 ය.
- ✓ මහාපරාක්‍රමබාහු රජ සමය ක්‍රි.ව. 1153 - 1186 යනුවෙන් පිළිගැනේ.

➢ පේළියක කෙළවරෙහි සම්පූර්ණ පදයක් සඳහා ඉඩ ප්‍රමාණය මඳ වූ අවස්ථාවක, එහි යෙදිය හැකි අවසන් පදයට පර ව යෙදේ. මෙසේ කැඩිය හැක්කේ ද පදයක් අකුරු හතරක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් යුක්ත නම් පමණි. හල් අකුරක් පමණක් දෙවන පේළියට එන සේ කැඩීම ද නුසුදුසු ය. හල් අකුරකින් ආරම්භ වන පද කොටසක් දෙවන පේළියට එන සේ කැඩීම ද නුසුදුසු ය

| සඳහ-<br>න්<br><br>විද්‍යා-<br>ත්මක | වැරදි | සඳ-<br>හන්<br><br>විද්‍යාත්-<br>මක | නිවැරදි |
|---|---|---|---|

**V. ඇල ඉර (/) - විකල්ප ව්‍යවහාර දැක්වීමට යෙදේ.**
- ✓ මේ පෙති/කරල් උදේ/සවස බොන්න.
- ✓ මේස/තේ හැන්දෙන් දෙක බැගින් කෑමට පෙර/පසු බොන්න.

**VI. වරහන් ( ) - විකල්ප ව්‍යවහාර දැක්වීමට යෙදේ**
- ✓ හ්‍රස්ව (කෙටි) ස්වර අටකි.
- ✓ පාර්ලිමේන්තුව පිහිටා ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර (කෝට්ටේ) ය.

**VII. විස්මයාදි ලකුණ (!) - විස්මයක්, ආශිර්වාදයක්, ප්‍රාර්ථනයක්, හඬ නගා කරන ආමන්ත්‍රණයක්, නොහොත් නියෝගයක්, හර්ෂයක්, ශෝකයක˚ ආදිය හඟවන ප්‍රකාශනයක යෙදේ.**
- ✓ අහෝ! දෙව්දත් නොදුටි මොක්පුර.
- ✓ මොනවා, කතරගම දෙවියන් හැබැහින් දැකලා!
- ✓ ඔබ හැමට නිදුක් නිරෝගි සුවය ලැබේවා!
- ✓ මම සුවපත් වෙම්වා!
- ✓ පුත්‍ර දරුවනේ!
- ✓ නො නවතිවු, ඉදිරියට ම යවු!
- ✓ ඒ ගැන අපට හතර හිනා!
- ✓ අනේ ඔහුට වුණු දේ!

**VIII.** **තනි උඩු කොමාව (')** - ශබ්ද සංවිධානය පිණිස පදයක අක්ෂරයක් ලොප් වුණු තැන ඇඟවීම සඳහා ඒ අකුරු පේළියට මඳක් ඉහළින් යෙදේ.

- ✓ පෙර'ඹර හිරු නැගෙයි.
- ✓ අප'තර
- ✓ හිර'වරණ

**IX.** **තනි උඩු කොමා ('')** - ප්‍රකෘති භාෂණයකට නොහොත් උද්ධෘත පාඨයකට අන්තර්ගත තවත් ප්‍රකෘති භාෂණයක්, උද්ධෘත පාඨයක් නොහොත් විශේෂ ව්‍යවහාරයක් දැක්වීමට යෙදේ.

- ✓ අක්ෂර, 'වර්ණ' යනුවෙන් ද හැඳින්වේ.
- ✓ "ඒ දියවැල හැඳින්වෙන්නේ 'කුරුසිවෝ' යනුවෙනි"යි ශිෂ්‍යයා පිළිතුරු දිනි.
- ✓ "කුමාරතුංග මුනිදාසයන්ගේ 'හත්පණ' කියවන්නැ" යි ගුරුතුමිය කීවා ය.

**X.** **යුගල උඩු කොමා (" ")** - ප්‍රකෘති භාෂණ, උද්ධෘත පාඨ සහ විශේෂ ව්‍යවහාර දැක්වීම සඳහා යෙදේ.

- ✓ "මෙහි එව " රජ නියෝග කළේ ය.
- ✓ 'මම ගෙදර යමි" යි හෙතෙම කී ය.
- ✓ "වඳිමු මුනි උතුමන් තිලෝගුරු" යනු ගුත්තිල කාව්‍යයේ පද්‍ය පාදයකි.

**XI.** **තිත් කොමාව (;)** - ඒක-කර්තෘක අන්තර් වාක්‍ය කිහිපයක් එකින් එක වෙන් කිරීමේ දී යෙදේ.

- ✓ විශේෂ අමුත්තා සතුටින් පිනා ගියේ ය; නළුවන් කරා පා නැගුවේ ය; සතුට පළ කළේ ය; සමු ගත්තේ ය.

**XII.** **ප්‍රශ්න ලකුණ (?)** - ප්‍රකාශයක් ප්‍රශ්නයක් බව දැක්වීමට එහි අගට යෙදේ.

- ✓ පුතා ගෙදර ගියා ද?
- ✓ මෙය කීයට ද ගත්තේ?
- ✓ ඊයේ නිවාඩුවක් ලැබුණේ නැහැ?

**ලිඛිත අභ්‍යාස**

මීට පෙර ශ්‍රේණිවල දී ඔබ උගත් විරාම ලක්ෂණ ආශ්‍රයෙන් පහත සඳහන් අභ්‍යාසවල නිරත වන්න.

1. පහත සඳහන් වාක්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

   i. ඒ වී සුරවීර මහතා සභාව අමතා හරවත් දේශනයක් පැවැත්වූයේ ය

ii. ස තො ස ට ගොස් පැමිණි කාන්තාව අම්මෝ බඩුවල ගණන් යැයි මිතුරියට කීවා ය

iii. දරුව ඔබට යහපතක් ම වේවා

iv. සිංහල ගැමි ජීවිතය විදහා දැක්වෙන නවකතාවකි කේ ජයතිලකයන්ගේ චරිත තුනක්

v. එස් මහින්ද හිමියන්ගේ දේශාභිමානී කවි මෙන් ම ළමා ගී ද රසවත් පද්‍ය නිර්මාණ ලෙස අගය කළ හැකි යැ යි දේශනයේ දී පැවසිණි

vi. පෙ ව 10.30 11.00 දක්වා විවේක කාලය යි

vii. කුරක්කන්වලින් විවිධ ආහාර වර්ග සාදනු ලැබේ

නිදසුන් හැලප තලප පිට්ටු රොටී

viii. චාරිකාව යන සෑම ශිෂ්‍යයකු ම අවශ්‍ය ආහාර පාර්සල් දෙක උදේ දවල් ගෙන ආ යුතු යැයි ගුරුතුමා දැන්වීම් පත්‍රිකාවේ සඳහන් කර තිබිණි

ix. අනේ එවිපත සිදුවුණි

x. තෙරේසා මවුතුමිය මුඩුක්කුවල සාන්තුවරිය 1910 1997 ලෙස හැඳින්වුණේ ඇය අසරණයන් උදෙසා සිදු කළ මෙහෙය නිසා ය

- **ලිඛිත අභ්‍යාස**

**1.**

I. ඒ. වී. සුරවීර මහතා සභාව අමතා හරවත් දේශනයක් පැවැත්වූයේ ය.

II. ස. තො. ස. ට ගොස් පැමිණි කාන්තාව “අම්මෝ! බඩුවල ගණන්” යැයි මිතුරියට කීවා ය.

III. දරුව, ඔබට යහපතක් ම වේවා!

IV. සිංහල ගැමි ජීවිතය විදහා දැක්වෙන නවකතාවකි, කේ. ජයතිලකයන්ගේ ‘චරිත තුනක්’

V. “එස්. මහින්ද හිමියන්ගේ දේශාභිමානී කවි මෙන් ම ළමා ගී ද, රසවත් පද්‍ය නිර්මාණ ලෙස අගය කළ හැකි යැ” යි දේශනයේ දී පැවසිණි.

VI. පෙ. ව. 10.30 - 11.00 දක්වා විවේක කාලය යි.

VII. කුරක්කන්වලින් විවිධ ආහාර වර්ග සාදනු ලැබේ.
නිදසුන් : හැලප, තලප, පිට්ටු, රොටී

VIII. ‘චාරිකාව යන සෑම ශිෂ්‍යයකු ම අවශ්‍ය ආහාර පාර්සල් දෙක උදේ/ දවල් ගෙන ආ යුතු යැ’යි ගුරුතුමා දැන්වීම් පත්‍රිකාවේ සඳහන් කර තිබිණි.

IX. අනේ! එව්පත සිදුවුණි.

X. තෙරේසා මවුතුමිය, 'මුඩුක්කුවල සාන්තුවරිය' (1910 - 1997) ලෙස හැඳින්වුණේ, ඇය අසරණයන් උදෙසා සිදු කළ මෙහෙය නිසා ය.

# අක්ෂර වින්‍යාස රීති

- ලේඛනයේ එන කිසියම් පදයකට අයත් අක්ෂර එකිනෙකට ගළපා ලියනු ලබන අනුපිළිවෙළ අක්ෂර වින්‍යාසය යනුවෙන් හැඳින්වේ.
- භාෂාව නිරවුල්ව භාවිතයටත් අර්ථාවබෝධයටත් අක්ෂර වින්‍යාස රීති හඳුනා ගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. එයින් ලේඛකයාගේ භාෂා කුසලතාව ද ඔප් නැංවෙයි.
- සිංහල ලේඛකයන් අතර පිළිගැනීමට ලක් වී ඇති අක්ෂර වින්‍යාස රීති හෙවත් රටා කිහිපයක් පහත දැක්වේ.

## I. මූර්ධජ ණ, දන්තජ න අක්ෂර යෙදීම

1. පාලි හා සංස්කෘත භාෂාවල යෙදෙන 'ණ' හෝ 'න' අකුරු සිංහලයෙහි ද ඒ ආකාරයෙන් ම යෙදේ. උදා:

| | | | |
|---|---|---|---|
| ආවේණික | අරුණාලෝකය | ගුණධර්ම | පුනර්භව |
| වාණිජ්‍යය | ජනගහනය | නිරූපණය | කනිෂ්ඨ |
| ප්‍රවීණ | සම්භාවනීය | ඛනිජ | ලේඛන |
| කෝණය | මර්දනය | නිර්වාණය | සංවර්ධනය |
| පරිණාමය | ත්‍යාග ප්‍රදානය | නිර්මාණ | පරිමාණය |
| මනඃකල්පිත | පරිගණකය | වර්තමාන | අනූන |
| ජයග්‍රහණය | ඝනාන්ධකාරය | | |

2. සමානරූපී වචනවල අර්ථයට අනුව 'ණ' හෝ 'න' යෙදේ. උදා:

| | |
|---|---|
| නුවණ (ඥානය) | නුවන (ඇස) |
| දණ (දණ හිස) | දන (ජනයා) |
| වණය (තුවාලය) | වනය (කැලය) |
| කණ (ඇසක් නොපෙනෙන) | කන (අනුභව කරන/ශ්‍රවණේන්ද්‍රිය) |
| ගැණ (ගණන් කොට) | ගැන (පිළිබඳ) |
| කුලුණු (කරුණාව) | කුලුනු (කණු) ය |

3. පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී එන ඇතැම් වචන, සිංහලයට අනුව සකස් වන විට 'ණ' අකුර 'න' බවට පත් වෙයි. උදා:

| | | |
|---|---|---|
| කර්ණ - කන් | ස්වර්ණ - රන් | වර්ණනා - වැනුම් |
| ශ්‍රවණ - සවන් | කෝණ - කොන | නිර්වාණ - නිවන |

4. පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී එන වචනවල ද ඊට අනුරූපව 'ණ' හෝ 'න' යෙදේ. උදා: සංලක්ෂණ - සලකුණු

| | | |
|---|---|---|
| ප්‍රාණ - පණ | තෘණ - තණ | අධිෂ්ඨාන - අදිටන |
| ප්‍රශ්න - පැන | ධරණී - දෙරණ | දුර්ජන - දුදන |
| ආසන - අසුන් | ලවණ - ලුණු | ආභරණ - අබරණ |
| දක්ෂිණ - දකුණ | ශාසන - සසුන් | කනිෂ්ඨ - කනිටු |
| ලශුන - ලූනු | උෂ්ණ - උණුසුම් | තීක්ෂණ - තියුණු |
| කල්‍යාණී - කැලණි | ස්ථාන - තැන් | නිදර්ශන - නිදසුන් |
| ප්‍රසන්න - පහන් | තරුණ - තුරුණු | භෝජන - බොජුන් |

## II. මූර්ධජ ළ, දන්තජ ල අක්ෂර යෙදීම

1. මාතෘ භාෂාවල හා ඉංග්‍රීසියේ 'ල' ශබ්දය සහිත පද සිංහලයට බිඳ ගැනීමේ දී දන්තජ 'ල' වශයෙන් ම සිටී. උදා:

| | | | | |
|---|---|---|---|---|
| කලාව | සිංහල | විද්‍යාලය | කොලරාව | රැලිය |
| කලාපය | කොලනිය | බාලිකාව | මංගල | කලල |

2. සමානරූපී වචනවල අර්ථයට අනුව 'ළ' හෝ 'ල' යෙදේ. උදා:

| | |
|---|---|
| ඇළ - දිය පාර | ඇල - පැත්ත |
| පැළ - පැළෑටි | පැල - කුඩා ගෙය |
| පිළි - රෙදි | පිලි - පිල්ලම් |
| මුළු - සියලු | මුලු - කොන් |
| අළු - ළිපේ අළු | අලු - ආලෝකය |
| තුළ - ඇතුළෙහි | තුල - සමාන |
| කුළ - කූටය | කුල - ගෝත්‍රය |
| දළ - දැඩි | දල - පත්‍ර |

3. පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී එන ඇතැම් වචන, සිංහලයට අනුව සකස් වන විට 'ට, ඨ, ඩ, ඪ' යන අකුරු 'ළ' බවට පත් වෙයි. උදා:

| | | |
|---|---|---|
| පටිමා - පිළිම | කුක්කුට - කුකුළු | දෘඪ - දැඩි |
| ඛේට - කෙළ | පඨවි - පොළොව | ක්‍රීඩා - කෙළි |
| නාටක - නළු | පටිපාටි - පිළිවෙළ | |

4. මාතෘ භාෂාවල 'ප්‍රති, පටි' උපසර්ග සිංහලයට බිඳීමේ දී 'පිළි' බවට පත් වෙයි. උදා:

| | |
|---|---|
| පිළිතුරු(ප්‍රතිඋත්තර/ප්‍රත්‍යුත්තර) | පිළිසරණ (පටිසරණ) |
| පිළිබඳ (ප්‍රතිබද්ධ) | පිළිසඳර (පටිසන්ථාර) |
| පිළිවෙත් (ප්‍රතිපත්ති) | පිළිවෙළ (පටිපාටි) |

## III. ශ, ෂ, ස අක්ෂර යෙදීම

1. මාතෘ භාෂා වචනවල ඇති 'ශ, ෂ, ස' අකුරු ඒ අයුරින් ම සිංහලයේ ද යෙදේ. උදා:

| | | | |
|---|---|---|---|
| විශ්වය | දෝෂ | ප්‍රශ්වාස | කොට්ඨාසය |
| ශූරතාව | ප්‍රසංගය | ආශ්වාස | විස්මය |
| විෂ | ආභාසය | | |

2. 'ක, ප, ඵ, ට, ඨ' අකුරකට පෙර මූර්ධජ 'ෂ' අකුර යෙදේ. උදා:

| | | | |
|---|---|---|---|
| දුෂ්කර | න්‍යෂ්ටික | විශිෂ්ට | ශ්‍රේෂ්ඨ |
| නිෂ්පාදනය | දෘෂ්ටිය | නිෂ්ඵල | පාපිෂ්ඨ |
| ශිෂ්ටාචාරය | විෂ්කම්භය | | |

3. 'ච' අකුරට පෙර තාලුජ 'ශ' යෙදේ. උදා:

| | | | |
|---|---|---|---|
| නිශ්චල | ආශ්චර්යය | තිරශ්චීන | විනිශ්චය |
| නිශ්චිත | | | |

4. 'ත, ථ' අකුරකට පෙර දන්තජ 'ස' යෙදේ. උදා:

| | | | |
|---|---|---|---|
| ස්තූපය | විස්තරය | ප්‍රස්තාව | පිරුළු |
| ප්‍රස්තාර | ප්‍රශස්ති | සමස්ත | ශාස්ත්‍ර |
| ස්ථූල | දේවස්ථාන | ගෘහස්ථ | මධ්‍යස්ථ |
| ස්ථාවර | විහාරස්ථානය | මාර්ගස්ථ | |

### ලිඛිත අභ්‍යාස

1. ඔබ උගත් අක්ෂර වින්‍යාස රීති ආධාර කර ගනිමින් හිස්තැන් පුරවන්න.

   i. ලබන පුන් පොහෝ දිනයෙහි පූර්__ චන්ද්‍රග්‍රහ__යක් සිදු වේ යැයි වි__වාස කෙරේ.

   ii. ක__ගුණ සැලකීම ශ්‍රේ__ඨ මා__ව ගු__ංගයකි.

   iii. දැඩි උ__ණාධික දේ__ගු__ය දරා ගත නො හැකිව විවිධ රටවල ජනයා දු__කරතාවන්ට මුහුණ දෙති.

   iv. ප්‍ර__න සියල්ලට ම සාර්ථකව පි__තුරු සැපයීමට සිසුන්ට හැකි විය.

   v. අපේ පුරා__ රජවරු වර්__ ජලයෙන් වැව් පුරවා, ඇ__වෙලි දිගේ කුඹුරුවලට ගෙන ගොස් වී ගොවිතැනින් රට __ශ්‍රීක ක__හ.

2. පහත දැක්වෙන දැන්වීම් පුවරුවල ඇති වැරදි වචන නිවැරදි කර ලියන්න.




3. පහත දී ඇති වචන අතුරින් අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන නිවැරදි කර ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | ආශීර්වාදය | ii. | තාක්ෂණය |
| iii. | ප්‍රමානය | iv. | වීරෝධාර |
| v. | සුළඟ | vi. | සුවිශේෂ |
| vii. | උත්කෘශ්ට | viii. | විශ්වාස |
| ix. | විශ්වකෝෂය | x. | ශ්‍රවනාගාරය |
| xi. | පෝසණය | xii. | දර්ශණය |
| xiii. | පැරනි | xiv. | පුෂ්ඵය |
| xv. | ණයකරු | xvi. | අනුශාසනය |
| xvii. | අභ්‍යවකාසය | xviii. | දොලොස්වැනිදා |
| xix. | වෙරළාසන්න | xx. | ඖෂධ |

4. 'අපේ සංස්කෘතික උරුමය' නම් ප්‍රකාශනයෙන් උපුටාගත් කොටස්වල ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන උපුටා දක්වන්න.

- **ලිඛිත අභ්‍යාස (Home Work)**

**1.**

I. ලබන පුන් පොහෝ දිනයෙහි පූර්ණ චන්ද්‍රග්‍රහණයක් සිදු වේ යැයි විශ්වාස කෙරේ.

II. කළගුණ සැලකීම ශ්‍රේෂ්ඨ මානව ගුණාංගයකි.

III. දැඩි උෂ්ණාධික දේශගුණය දරා ගත නො හැකිව විවිධ රටවල ජනයා දුෂ්කරතාවන්ට මුහුණ දෙති.

IV. ප්‍රශ්න සියල්ලට ම සාර්ථකව පිළිතුරු සැපයීමට සිසුන්ට හැකි විය.

V. අපේ පුරාණ රජවරු වර්ෂා ජලයෙන් වැව් පුරවා, ඇළ වේළි දිගේ කුඹුරුවලට ගෙන ගොස් වී ගොවිතැනින් රට සශ්‍රීක කළහ.

**2.**

I. පුස්තකාලය තුළ නිශ්ශබ්දව හැසිරෙන්න.

II. කුණු කසළ දැමීම සම්පූර්ණයෙන් තහනම්.

III. විහාරස්ථාන භූමියේ කෙල/කෙළ ගැසීමෙන් වළකින්න.

IV. පාරිභෝගික මිල දර්ශනය

V. මහා පොත් ප්‍රදර්ශනය බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ.

**3.**

I. ආශීර්වාදය
II. තාක්ෂණය
III. ප්‍රමාණය
IV. විරෝධාර
V. සුළඟ
VI. සුවිශේෂ
VII. උත්කෘෂ්ට
VIII. විශ්වාස
IX. විශ්වකෝෂය
X. ශ්‍රවණාගාරය
XI. පෝෂණය
XII. දර්ශනය
XIII. පැරණි
XIV. පුෂ්පය
XV. ණයකරු
XVI. අනුශාසනය
XVII. අභ්‍යවකාශය
XVIII. දොළොස්වැනිදා
XIX. වෙරළාසන්න
XX. ඖෂධ

4.

I. සිලාසොබ්භකණ්ඩක චේතිය

සිලාසොබ්භකණ්ඩක, අභය, සිලාසොබ්භකණ්ඩක, කනිට්ඨතිස්ස, ථූපඝරයක්, ගෝඨාභය, ථූපඝරයක්, සාධක, ථූපාරාම, ථූපඝරයට, ථූපඝරය, සාධක, ථූපාරාම, ථූපඝරයේ, සාධක

II. රත්නප්‍රාසාදය

අභයගිරි, අභයගිරි, භික්ෂූන්ට, උපෝසථාගාරයක්, කනිට්ඨතිස්ස



## ගුරු අත් පොතෙන්

ඇමුණුම 1 - නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. මුළු රාත්‍රිය ම........................... තුළ නිදිවර්ජිත ව රැඳී සිටින ගොවියා ........................... ගොයම සතුන්ගෙන් ආරක්ෂා කරයි. (පැළ/පැල)
2. මග සලකුණු නොසලකා ........................... ගිය පිරිස බොරු ........................... ගැන නො දැන එහි වැටී තුවාල ලැබූහ. (වළ/වල)
3. ධර්ම ශාලාවට පිවිසි ........................... භික්ෂූන් වහන්සේට ........................... නමා වැන්දෝ ය.(දණ/දන)
4. ........................... අලියාගේ එක් කකුළක් ........................... වී ඇති අයුරු පශු වෛද්‍යවරයාගේ අවධානයට ලක් විය. (වණ/වන)

ඇමුණුම 2 - නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. ........................... (උශ්ණාධික/උෂ්ණාධික) ආහාර ගැනීමෙන් වළකින ලෙස වෛද්‍යවරයා රෝගියාට අවවාද කළේ ය.
2. එදිනෙදා ගමන් බිමන් පහසු කර ගැනීම සඳහා ........................... (දක්ෂිණ/ දක්ශින) අධිවේගී මාර්ගය ජනතාවට මහඟු මෙහෙයක් සපයයි.
3. සිංහල විෂය සඳහා ශිෂ්‍යයන් ලබා ගෙන ඇති ලකුණු ........................... (අවරෝහණ/අවරෝහන) පිළිවෙළට සැකසීමට ගුරුවරයා සිතුවේ ය.
4. ලංකාවට ........................... (ආවේනි ක/ආවේණික) සත්ත්ව හා ශාඛ විශේෂ කිහිපයක් දක්නටඇත.
5. ........................... (ධර්මිෂ්ඨ/ධර්මිෂ්ට) සමාජයක් උදෙසා කැපවීම ජාතියක වගකීමකි.

6. ......................... (දෘෂ්ටි, දෘශ්ටි) ඌනතාවෙන් පෙළෙන අය වෙනුවෙන් ඇස් කණ්ණාඩි නොමිලේ ලබා දීමට තරුණ සංවිධානයක් කටයුතු කරයි.

7. දිනාගත් නිදහස ආරක්ෂා කර ගැනීමට සියලු ජනතාව ......................... (අධිශ්ඨාන. අධිෂ්ඨාන) කර ගත යුතු බව ජනාධිපතිතුමා අවධාරණය කළේ ය.

8. ......................... (ප්‍රවීණ/ප්‍රවීන) කලාකරුවන්ගේ සේවය ඇගයීම සඳහා උපහාර උළෙලක් සංවිධානය කිරීමට සංවිධාකයෝ පෙළ ගැසුණහ.

9. ශ්‍රී පාදස්ථානය වන්දනා කළ පිරිස හිරු උදාවේ ......................... (ආශ්චර්යය/ආස්චර්යය) අමන්දානන්දයට පත් වූහ.

10. ......................... (කනිෂ්ඨ/කනිෂ්ට) සේවයන්ගේ ද වැටුප් වැඩි කිරීමට ආයතන ප්‍රධානියා ගත් තීරණය සියලු දෙනාගේ ම පැසසුමට ලක් විය.

## ගුරු අත් පොතෙන්-පිළිතුරු

ඇමුණුම 1 - නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. මුළු රාත්‍රිය ම පැළ තුළ නිදිවර්ජිත ව රැදී සිටින ගොවියා පැල ගොයම සතුන්ගෙන් ආරක්ෂා කරයි. (පැළ/පැල)

2. මග සලකුණු නොසලකා වල ගිය පිරිස බොරු වළ ගැන නො දැන එහි වැටී තුවාල ලැබූහ. (වළ/වල)

3. ධර්ම ශාලාවට පිවිසි දන භික්ෂූන් වහන්සේට දණ නමා වැන්දෝ ය. (දණ/දන)

4. වන අලියාගේ එක් කකුලක් වණ වී ඇති අයුරු පශු වෛද්‍යවරයාගේ අවධානයට ලක් විය. (වණ/වන)

ඇමුණුම 2 - නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. උෂ්ණාධික (උශ්ණාධික/උෂ්ණාධික) ආහාර ගැනීමෙන් වළකින ලෙස වෛද්‍යවරයා රෝගියාට අවවාද කළේ ය.

2. එදිනෙදා ගමන් බිමන් පහසු කර ගැනීම සඳහා දක්ෂිණ (දක්ෂිණ/දක්ශින) අධිවේගී මාර්ගය ජනතාවට මහඟු මෙහෙයක් සපයයි.

3. සිංහල විෂය සඳහා ශිෂ්‍යයන් ලබා ගෙන ඇති ලකුණු අවරෝහණ (අවරෝහණ/අවරෝහන) පිළිවෙළට සැකසීමට ගුරුවරයා සිතුවේ ය.

4. ලංකාවට ආවේණික (ආවේනික/ආවේණික) සත්ත්ව හා ශාඛ විශේෂ කිහිපයක් දක්නටඇත.

5. ධර්මිෂ්ඨ (ධර්මිෂ්ඨ/ධර්මිෂ්ට) සමාජයක් උදෙසා කැපවීම ජාතියක වගකීමකි.

6. දෘෂ්ටි (දෘෂ්ටි, දෘශ්ටි) ඌනතාවෙන් පෙළෙන අය වෙනුවෙන් ඇස් කණ්ණාඩි නොමිලේ ලබා දීමට තරුණ සංවිධානයක් කටයුතු කරයි.

7. දිනාගත් නිදහස ආරක්ෂා කර ගැනීමට සියලු ජනතාව අධිෂ්ඨාන (අධිශ්ඨාන. අධිෂ්ඨාන) කර ගත යුතු බව ජනාධිපතිතුමා අවධාරණය කළේ ය.

8. ප්‍රවීණ (ප්‍රවීණ/ප්‍රවීන) කලාකරුවන්ගේ සේවය ඇගයීම සඳහා උපහාර උළෙලක් සංවිධානය කිරීමට සංවිධාකයෝ පෙළ ගැසුණහ.

9. ශ්‍රී පාදස්ථානය වන්දනා කළ පිරිස හිරු උදාවේ ආශ්චර්යය (ආශ්චර්යය/ආස්චර්යය) අමන්දානන්දයට පත් වූහ.

10. කනිෂ්ඨ (කනිෂ්ඨ/කනිෂ්ට) සේවයන්ගේ ද වැටුප් වැඩි කිරීමට ආයතන ප්‍රධානියා ගත් තීරණය සියලු දෙනාගේ ම පැසසුමට ලක් විය.



NALANDA V **නාලන්දා විද්‍යාලය - කොළඹ 10** DA VIDYALAYA

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණය** NALANDA VIDYALAYA

| **9 ශ්‍රේණිය** | **සිංහල** | **ඒකකය : 5** |
|---|---|---|

## නිවැරදි ශබ්දෝච්චාරණය - විරාම ලක්ෂණ හා අක්ෂර වින්‍යාස රීති

I කොටස

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1) සිලාසොබ්භකණ්ඩක චෛතියට ථූපඝරයක් කළවූ රජු නම් කරන්න.

........................................................................................................................................................

2) එම චෛත්‍යය නිර්මාණය කරන ලද රජතුමා නම් කරන්න.

........................................................................................................................................................

3) රත්නප්‍රසාදය පිළිබඳ වාක්‍ය 4 ක් ලියන්න.

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

4) චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ රචනා කොට ඇති රීතිය කුමක් ද?

........................................................................................................................................................

5) මුල් කාලයේ දී ගුරු ගෙදර අධ්‍යාපනය ලැබූ සිසුන් අකුරු ලිවීම කරන ලද්දේ කෙසේ ද?

........................................................................................................................................................

(ලකුණු 10)

6) ප්‍රත්‍ය ශතකයේ එන පහත සඳහන් ශ්ලෝකය සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

හංසො විභාති සරසීරුහ වාරි මධ්‍යෙ

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

තේරුම

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

(ලකුණු 10)

7) ධම්ම පදයේ පණ්ඩිත වග්ගයේ සඳහන් පාලි ගාථාව හා එහි තේරුම ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

තේරුම

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 10)

## II කොටස

8) පහත සඳහන් වාක්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

I. මුවන්තිස්ස කුමාරයාගේ එක් යහළු කුමාරයකුගේ නාමය අලියන්තිස්ස ය

II. කිරිබබාගේ දලට එදින කටුමස්සෝ පරාටි කටිල්ලෝ ලීල්ලෝ පැන්නෝ කපුහැන්දෝ අඟුලුවෝ යන ආදීහු අසු වූහ

III. අම්මේ හෙට අලුත් මහත්තයාත් එක්ක මං කැකිරා යනවා

IV. ධීවර ගැමියා මුහුදු යෑමේ දී ඉයත්තුව කෙරෙහි සැලකිලිමත් වෙයි ඉයත්තුව යනු කාලගුණ ය යි මුහුදු රළ මාරියාව යි

V. මුදලිහාමි හෙට හවස ගෙදර වැඩක් මොකුත් තියෙනවා ද

VI. වේලාව පෙ ව 9 30 පමණ විය අපි ලං වි ම යනුවෙන් නම සඳහන් ගොඩනැගිල්ලක් අසල නතර වීමු

VII. අනේ ඔවුන්ට සිදුවුණ විපත

VIII. ඔවුන්ට ලැබුණ මුදල 3 2 අනුපාතයෙන් බෙදන ලදී

IX. පාර්ලිමේන්තුව පිහිටා ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ය

X. බෙහෙත් ගැනීම මේස තේ හැන්දෙන් දෙක බැගින් කෑමට පෙර පසු බොන්න (ලකුණු 10)

9) පහත සඳහන් වචන වැරදි නම් නිවැරදි කර ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | ආඥාපණත | - __________ | VI. | අනුස්මරන | - __________ |
| II. | ඥාණ | - __________ | VII. | කුරුනෑගල | - __________ |
| III. | කණගාටු | -__________ | VIII. | නවීකරනය | - __________ |
| IV. | ගොණුව | - __________ | IX. | නිර්මාන | - __________ |
| V. | ලේඛණ | - __________ | X. | කණිටු | - __________ |

(ලකුණු 10)

10) පහත සඳහන් වචනවල තේරුම් ලියන්න.

උදා:- දණ - දණහිස

දන - ජනයා

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | වෙණ | - __________ | VI. | වෙන | - __________ |
| II. | නුවණ | - __________ | VII. | නුවන | - __________ |
| III. | සරණ | -__________ | VIII. | සරන | - __________ |
| IV. | උණු | - __________ | IX. | උනු | - __________ |
| V. | මරණ | - __________ | X. | මරන | - __________ |

(ලකුණු 10)

11) නිවැරදි වචනය හිස්තැන මත ලියන්න.

I. දොඩම් ගසෙහි .......................... (පල / පල) බර වී අතු බිමට නැමී තිබේ.

II. කොහොඹ ගහට කරවිල .............................. (වැල / වැළ) ගියා වගෙයි.

III. මිනිසා පාර අසල මල් ............................... (පැල / පැළ) විකුණයි.

IV. සොර ....................... (මුල / මුළ) මග අසල රැක සිටිති.

V. ගොවියා පන්දම රැගෙන ..................... (පැළ / පැල ) වෙත ගියේ ය.

VI. බුදුහු ලෝවැසියන් කෙරෙහි ........................ (පතළ / පතල) මහා කරුණාවෙන් දහම් දෙසූහ.

VII. මිනිරන් ....................... (පතළ / පතල) කඩා වැටීම නිසා කම්කරුවෝ එහි සිරවූහ.

VIII. වනාන්තරයට පිවිසෙත්ම මග ........................ (අසළ / අසල) මොනරු දක්නට ලැබුණි.

IX. ගොම මැටි ........................ (අතුල / අතුළ) කුඩා නිවස තුළ මහත් සිසිලසක් දැනුණි.

X. වහලය දිරා තිබූ බැවින් ගෙය ......................... (තුල / තුළ) සිටි සැම දෙනා වර්ෂාවට තෙමුනි.

(ලකුණු 10)

12) පහත දී ඇති වචනවලට නිවැරදි අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

I. දු ____ කර සේවය (ශ්, ෂ්)

II. පාපි____ ය මිනිස්සු (ශ්, ෂ්)

III. නි ____ චිත පිළිතුර (ශ්, ෂ්)

IV. ප්‍ර ____ වාස වාතය (ශ්, ස්, ෂ්)

V. ප්‍රශ ____ති ගායනා (ශ්, ස්)

VI. නි ____ පාදන පිරිවැය (ශ්, ෂ්)

VII. නිවැරදි විනි ____ චය (ෂ්, ශ්)

VIII. ස්____ වර දුරකතන (ථා, තා)

IX. මධ්‍යස් ____ විචාරය (ත, ථ)

X. ස් ____ ප සරය (තූ, ථූ)

(ලකුණු 10)

13) පහත වාක්‍යයන්හි නිවැරදි අක්ෂර හිස්තැන් මත ලියන්න.

I. පොත මත නිදි කිර____ දරුවාගේ මේසය මත හිරු කිර____ වැටී ඇත.

II. අහසෙහි සර____ කුරුල්ලෝ සිය සර____ පිහිට කොට පියාසාර කරති.

III. වැඩ මු ____ වට පැමිණි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ තැනින් තැන මු ____ වල කසළ දැමූහ.

IV. සඳකඩ පහ____ මත පොල්තෙල් පහ____ දල්වා ඇත.

V. ව____ වැදී ඇති ඇතාගේ කකුලෙහි විශාල ව ____ යක් ඇත.

VI. නො 20 දර____ කූඩුවේ සිටින නාගයා දර____ ගසා ගෙන සිටී.

VII. ඇස ක____ මහල්ලාගේ ක ____ ද නොඇසේ.

VIII. ත්‍යාග ප්‍ර ____ නෝත්සවය පැවැත් වූයේ ප්‍ර ____ න ශාලාවේ ය.

IX. කුරක්කන් පැ____ ඌරන්ගෙන් බේරා ගැනීමට ගොවියා හේනේ පැ____ වෙත ගියේය.

X. ප්‍ර ____ න සියල්ලට ම සාර්ථකව පි ____තුරු සැපයීමට සිසුන්ට හැකි විය.

(ලකුණු 20)

# පිළිතුරු



**Answer**

## නිවැරදි ශබ්දෝච්චාරණය
## විරාම ලක්ෂණ හා අක්ෂර වින්‍යාස රීති
## I කොටස

1. කනිට්ඨතිස්ස රජු
2. වට්ටගාමණී අභය රජු
3. 
   I. අභයගිරි විහාරයේ ස්තූපයට බටහිරින් ඇති විශාල ගොඩනැගිල්ලේ අවශේෂ රත්නප්‍රාසාදය ලෙස හැඳිනගෙන තිබේ.
   II. එය ක්‍රි. ව. 2 සියවසේ දී කනිට්ඨතිස්ස රජු විසින් කරවන ලද්දක් වන අතර අභයගිරි විහාරයේ භික්ෂූන්ට පොහොය කිරීම සඳහා උපෝසථාගාරයක් ලෙස තනා ඇත.
   III. 2 වැනි මහින්ද (ක්‍රි. ව. 777-779) එය ඉතා අලංකාර ලෙස නැවත කරවූ අතර ඔහු එහි රන් බුදුපිළිමයක් ද තැන්පත් කරවී ය.
   IV. 1 වැනි සේන දවස (ක්‍රි. ව. 833-853) ඒ පිළිමය හා වටිනා වස්තු පාණ්ඩ්‍යයන් විසින් පැහැරගෙන ගිය අතර, 2 වැනි සේන (ක්‍රි. ව. 853-887) ඒවා නැවත ලබාගෙන එහි තැන්පත් කෙළේ ය.
4. අසා රස විඳීම අරමුණු කර ගත් බණ කථා රීතියෙනි.
5. පැරණි අධ්‍යාපනයේ දී ප්‍රමුඛතාවක් හිමි වූයේ ශ්‍රවණයට ය. පොත පත බහුල නොවූ සමාජයේ කියවූ දේ ශ්‍රවණය කිරීමෙන් බොහෝ දෙනා දැනුම ලැබූහ. අකුරු ලිවීම සඳහා ගල් ලෑල්ල හෝ වැලි පීල්ල භාවිතා කරන ලදී.
6. හංසො විභාති සරසීරුහ වාරි මධ්‍යෙ
   සිංහො විභාති ගිරිකුංජර නිර්ඣරෙ ච
   ජාතෙ‍්‍යා විභාති තුරගො රණ වීර මධ්‍යෙ
   විද්වාන් විභාති පුරුෂෙෂු විචක්ෂණෙෂු

   හංසයා බබළන්නේ ජලාශයන්හි දී ය.
   සිංහයාගේ වික්‍රමාන්විත බව ඇතුන් මැද ය.
   සෛන්ධව අශ්වයාගේ බලය යුද්ධ භූමියේ දී ය.
   විද්‍යාවන්ත පණ්ඩිතයාගේ බැබළීම එබඳු ම පණ්ඩිතයන් මැද ය.

7. න භජෙ පාපකෙ මිතෙත
න භජෙ පුරිසාධමෙ
භජේථ මිතෙත කලයාණෙ
භජේථ පුරිසුතත මෙ

පාප මිත්‍රයන් හා අසත්පුරුෂයන් ඇසුරු නොකළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් හා සත්පුරුෂයන් ම ඇසුරු කළ යුතු ය.

8.

I. මුවන්තිස්ස කුමාරයාගේ එක් යහළු කුමාරයකුගේ නාමය අලියන්තිස්ස ය.

II. කිරිබබාගේ දැලට එදින කටුමස්සෝ, පරාටි, කටිල්ලෝ, ලීල්ලෝ, පැන්නෝ, කපුහැන්දෝ, අඟුලුවෝ යන ආදීහු අසු වූහ.

III. "අම්මේ, හෙට අලුත් මහත්තයාත් එක්ක මං කැකිරාවට යනවා."

IV. ධීවර ගැමියා මුහුදු යෑමේ දී 'ඉයත්තුව' කෙරෙහි සැලකිලිමත් වෙයි. ඉයත්තුව යනු කාලගුණ ය යි. මුහුදු රළ 'මාරියාව' යි.

V. "මුදලිහාමි, හෙට හවස ගෙදර වැඩක් මොකුත් තියෙනවා ද?"

VI. වේලාව පෙ. ව. 9. 30 පමණ විය; අපි 'ලං. වි. ම.' යනුවෙන් නම සඳහන් ගොඩනැගිල්ලක් අසල නතර වීමු.

VII. අනේ! ඔවුන්ට සිදුවුණ විපත.

VIII. ඔවුන්ට ලැබුණ මුදල 3 : 2 අනුපාතයෙන් බෙදන ලදී.

IX. 'පාර්ලිමේන්තුව' පිහිටා ඇත්තේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ය.

X. බෙහෙත් ගැනීම - මේස තේ හැන්දෙන් දෙක බැගින් කෑමට පෙර/ පසු බොන්න.

9.

| | | |
|---|---|---|
| I. ආඥාපණත | - | ආඥාපනත |
| II. අනුස්මරන | - | අනුස්මරණ |
| III. ඥාණ | - | ඥාන |
| IV. කුරුනෑගල | - | කුරුණෑගල |
| V. කණගාටු | - | කනගාටු |
| VI. නවීකරනය | - | නවීකරණය |
| VII. ගොණුව | - | ගොනුව |
| VIII. නිර්මාන | - | නිර්මාණ |
| IX. ලේඛණ | - | ලේඛන |
| X. කණිටු | - | කනිටු |

**10.**

I. වෙණ - වීණාව
II. වෙන - වෙනත්
III. නුවණ - ඥානය
IV. නුවන - ඇස
V. සරණ - පිහිට
VI. සරන - හැසිරෙන
VII. උණු - උණුසුම්/ උෂ්ණ
VIII. උනු - ඌන/ අඩු
IX. මරණ - මරණයට පත් වී අවසන්
X. මරන - මෙතෙක් මරණයට පත් වී අවසන් නොවූ

**11.**

I. දොඩම් ගසෙහි ........................... (පල / එල) බර වී අතු බිමට නැමී තිබේ.
II. කොහොඹ ගහට කරවිල ............................... (වැල/ වැළ) ගියා වගෙයි.
III. මිනිසා පාර අසල මල් ................................ (පැල/ පැළ) විකුණයි.
IV. සොර ........................ (මුල / මුළ) මග අසල රැක සිටිති.
V. ගොවියා පන්දම රැගෙන ...................... (පැළ/ පැල ) වෙත ගියේ ය.
VI. බුදුහු ලෝවැසියන් කෙරෙහි .......................... (පතළ/ පතල) මහා කරුණාවෙන් දහම් දෙසූහ.
VII. මිනිරන් ........................ (පතළ/ පතල) කඩා වැටීම නිසා කම්කරුවෝ එහි සිරවූහ.
VIII. වනාන්තරයට පිවිසෙත්ම මග .......................... (අසළ/ අසල) මොනරු දක්නට ලැබුණි.
IX. ගොම මැටි ......................... (අතුල/ අතුළ) කුඩා නිවස තුළ මහත් සිසිලසක් දැනුණි.
X. වහලය දිරා තිබූ බැවින් ගෙය .......................... (තුල/ තුළ) සිටි සැම දෙනා වර්ෂාවට තෙමුනි.

**12.**

I. දු ...... කර සේවය (ශ්, ෂ්)
II. නි ...... පාදන පිරිවැය (ශ්, ෂ්)
III. පාපි ...... ඨ මිනිස්සු (ශ්, ෂ්)

IV. නිවැරදි විනි ...... චය (ෂ්, ශ්)
V. නි ...... චිත පිළිතුර (ශ්, ෂ්)
VI. ස් ...... වර දුරකතන (ථා, තා)
VII. ප්‍ර ...... වාස වාතය (ශ්, ස්, ෂ්)
VIII. මධ්‍යස් ...... විචාරය (ත, ථ)
IX. ප්‍රශ ...... ති ගායනා (ශ්, ස්)
X. ස් ...... ප ඝරය (තූ, ථූ)

13.

I. පොත මත නිදි කිරන දරුවාගේ මේසය මත හිරු කිරණ වැටී ඇත.
II. අහසෙහි සරන කුරුල්ලෝ සිය සරණ පිහිට කොට පියාසාර කරති.
III. වැඩ මුළුවට පැමිණි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ තැනින් තැන මුලුවල කසළ දැමූහ.
IV. සඳකඩ පහණ මත පොල්තෙල් පහන දල්වා ඇත.
V. වන වැදී ඇති ඇතාගේ කකුලෙහි විශාල වණයක් ඇත.
VI. නො. 20 දරන කූඩුවේ සිටින නාගයා දරණ ගසා ගෙන සිටී.
VII. ඇස කණ මහල්ලාගේ කන ද නොඇසේ.
VIII. ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත් වූයේ ප්‍රධාන ශාලාවේ ය.
IX. කුරක්කන් පැළ උඟුරන්ගෙන් බේරා ගැනීමට ගොවියා හේනේ පැල වෙත ගියේය.
X. ප්‍රශ්න සියල්ලට ම සාර්ථකව පිළිතුරු සැපයීමට සිසුන්ට හැකි විය.



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ